අලි ඇතුන් බලන්න කවුඩුල්ලට එන්න

එන්. ටී ගමගේ

අලි ඇතුන් බලන්න කවුඩුල්ලට එන්න 20 වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාවෙන් 70%ක් ම වැසී තිබුණේ වනාන්තරවලිනි. එවකට, එනම් 1900 ආරම්භ වන කාලයේ දී මේ වන ගහණය නිසා ම ඊට සාපේක්ෂව රට පුරා ම ව්‍යාප්ත ව ගිය අලි ඇතුන් ගහණයක් ද ශ්‍රී ලංකාව සතු විය. ඒ වන විටත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයන් විසින් නැටි (වල්ග) ගණනට තෑගි ලබා දෙමින් මහා පරිමාණයෙන් මෙරට අලි ඇතුන් දඩයක්කරුවන් ලවා මරා තිබුණ ද 1900 වන විටත් සැළකිය යුතු අලි ඇතුන් සංඛ්‍යාවක් මෙරට වාසය කළහ.

විශේෂයෙන් ම මධ්‍යම කඳුකරයේ හදවත වන මහඑළිය (හෝර්ටන් තැන්න) වනෝද්‍යානය තුළ ද 20 වන සියවස ආරම්භයේ දී අලිඇතුන් වාසය කළ බවත් පහළින් ඇති වස්ගමුව වැනි වනෝද්‍යානවල සිට පවා 'නිලූ' නැමති ශාකය කෑමට හෝර්ටන්තැන්නට අලි ඇතුන් පැමිණි බවත් වාර්තාව සඳහන් වේ.

20 වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාව තුළ මෙතරම් ම අලි ඇතුන් ව්‍යාප්තියක් පැවැතිය ද ඉතාම ඉක්මනින් පසුගිය සියවස තුළ සිදු වූ වේගවත් මිනිස් ජනාවාස ව්‍යාපෘතිය හේතුවෙන් වනගහණය බලා සිටිද්දී අඩුවන්නට විය. එම නිසා ම වාසස්ථාන සහ ආහාර අර්බුදයට ද ඒ වේගයෙන් ම මුහුණ දුන් අලි ඇතුන් ද ඉතාම ඉක්මණින් ම මේ බිමින් වඳවී යාම ආරම්භ විය. මෙම තත්වය හේතුකොට ගෙන මේ වන විට ශ්‍රී ලංකාවේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් වනාන්තර සඳහා වෙන්ව ඇත්තේ 20% කට ආසන්න සුළු භූමි ප්‍රමාණයක් පමණකි. එම සීමිත භූමි ප්‍රමාණයෙනුත් අලි ඇතුන් වාසය කරන වනජීවී රක්ෂිත සඳහා වෙන්ව ඇත්තේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 14% කි. මෙම 14% ක අරක්ෂිත භූමි ප්‍රමාණය රටපුරා වෙන්වෙන් ව පිහිටා ඇති ආකාරය අනුව ජාතික වනෝද්‍යාන 18 ක් වශයෙන් බෙදා නම් කර ඇත. වනෝද්‍යාන 18 අතරිනුත් මේ වන විට ඉතාම සීමිත සංඛ්‍යාවකට සීමාවී ඇති වල් අලි ඇතුන් දැකබලා ගැනීමට ප්‍රචලිත වනෝද්‍යාන කිහිපයක් වෙයි. ඒ අතරින් ප්‍රධානම තැනක් ගන්නේ උඩවලව ජාතික වනෝද්‍යානයයි. එකවර වල් අලි 130 - 150 ක පමණ විශාල රංචුවක් දැකබලා ගත හැකි උඩවලව ජාතික වනෝද්‍යාන මේ හේතුව නිසා ම සංචාරකයන්ගේ ද පාරාදීසයක් බවට පත් වී ඇත. උඩවලවට අමතරව නිදහසේ ගැවසෙන වල් අලින් දැක බලාගැනීමට ඉතාම යෝග්‍ය වනෝද්‍යාන වශයෙන් ලාහුගල, සෝමාවතිය සහ මින්නේරිය හඳුන්වා දිය හැකි ය. යාල (රුහුණු) කුමන, විල්පත්තුව, වස්ගමුව, මාදුරුඔය, ගල්ඔය, ලුණුගම්වෙහෙර සහ බුන්දල වැනි ජාතික වනෝද්‍යානවල අලි ඇත්තු සැලකිය යුතු ප්‍රමාණයක් වාසය කරති. මෙහි සඳහන් කළ සියලු ම ජාතික වනෝද්‍යානවලට අමතරව වසරේ වැඩි කාලයක් පුරා වල් අලින් දැක බලා ගත හැකි තවත් මනරම් වනෝද්‍යානයක් වේ. එය නමින් කවුඩුල්ල ජාතික වනෝද්‍යානයයි. කවුඩුල්ල ජාතික වනෝද්‍යානය පිහිටා ඇත්තේ උතුරුමැද පළාතට අයත් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ හා මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨශ දෙකට අයත්ව පිහිටා ඇති ඉපැරණි කවඩුල්ල වැව ආශ්‍රිත වනාන්තර ප්‍රදේශය කවුඩුල්ල ජාතික වනෝද්‍යානය ලෙසින් නම්කර ඇත. කවුඩුල්ල වැව ආශ්‍රිතව පිහිටි වනාන්තරය කලක් තිස්සේ ම පැවැතුණේ අභයභූමියක් වශයෙනි. මෙම භූමි භාගය ජාතික වනෝද්‍යානයක් ලෙසින් නම් කරන ලදදේ 2002 වර්ෂයේ දී ය. ඊට අයත්වන භූමි ප්‍රමාණය හෙක්ටයාර 6900 කි. දැනට මෙරට පවතින අනෙකුත් ජාතික වනෝද්‍යාන සහ වනජීවී රක්ෂිත ලෙසට ප්‍රකට භූමිභාගයන්ට පොදු ලක්ෂණයක් මෙම කවුඩුල්ල ජාතික වනෝද්‍යානයට ද වැදගත්කමක් සපයනු ලබයි. එනම් පැරණි රජ දරුවන් විසින් කරන ලද දැවැන්ත වැව් අතරින් වියළි කලාපයේ ජනයාට මෙන් ම වන සතුන්ට ද දියවර සැපයූ මහ වැවක් කවුඩුල්ල වනෝද්‍යානයට ද අයත්ව තිබීමයි. කවුඩුල්ල නම් මෙම දැවැන්ත වාරි නිර්මාණය කරවන ලද්දේ මීට සියවස් 17 කට පමණ පෙර මහා මින්නේරිය වැව නිර්මාණය කර මින්නේරිය දෙවියන් නමින් ඉතිහාස ගත වූ මහසෙන් රජු විසිනි. කවුඩුල්ල වැව මහසෙන් රජුගේ ම නිර්මාණයක් ලෙසින් ඉතිහාසයේ බොහෝ තැන්වල සඳහන්ව තිබුණ ද එය මහසෙන් රජුගේ සොයුරිය වූ බිසෝ බණ්ඩාර කුමරිය විසින් නිර්මාණය කරවන ලද්දක්ය යනුවෙන් ජනප්‍රවාදවල සඳහන් වෙයි. එම ජනප්‍රවදවලට අනුව බිසෝ බණ්ඩාර කුමරිය මෙම වැව සාදා නිම කර ඇත්තේ තම සහෝදරයා (මහසෙන්) නෑබිලියක් (මින්නේරිය වැව) තනද්දී තමා කොරහක් තැනූ බවට උදම් අනමිනි. අක්කර අඩි එක්ලක්ෂ දසදහසක ජල ධාරිතාවකින් යුත් මින්නේරිය වැව සාදා මහසෙන් රජු මින්නේරිය දෙවියන් වෙද්දී, අක්කර අඩි එක් ලක්ෂ දහසය දහසක කවුඩුල්ල වැව සාදා බිසෝ බණ්ඩාර කුමරිය බිසෝ බණ්ඩාර දේවතාවිය බවට පත් වූ බව මෙම ජනප්‍රවාදයේ වැඩිදුරටත් සඳහන් වෙයි. අදටත් කවුඩුල්ල වැව තනා නිමකළා යැයි කියන බිසෝ බණ්ඩාර දේවතාවිය සිහි කිරීම සඳහා තැනූ බිසෝ බණ්ඩාර දේවාලයක් කවුඩුල්ල වැව ආසන්නයේ දැකගත හැකි ය. මෙම වැවේ දියවරින් කුඹුරු අස්වද්දාගන්නා රජරට ගොවියා අලුත් සහල් මංගල්‍යයෙන් මෙම දේවාලය පුදා බිසෝ බණ්ඩාර දේවතාවියගේ පිහිට ලබා ගැනීමට ද අමතක නොකරති. කවුඩුල්ල වැවේ නැඟෙනහිර පිහිටි මැදිරිගිරියේ, බිසෝ බණ්ඩාර ගමට නුදුරෙන් වැව් කණ්ඩිය මත මෙම බිසෝ බණ්ඩාර දේවාලය පිහිටා ඇත. (කවුඩුල්ල වැව නිර්මාණය කරවන ලද්දේ බිසෝ බණ්ඩාර කුමරිය යැයි විවිධ ජනප්‍රවාදවල සඳහන්ව පැවැතියත් මහාවංශය වැනි ලිඛිත ඉතිහාස ග්‍රන්ථවල සඳහන්ව ඇත්තේ කවුඩුල්ල වැව මහසෙන් රජුගේ නිර්මාණයක් ලෙසිනි) කවුඩුල්ල ජලාශය ලෙසින් ද හැඳින්වෙන මෙම වැවට ඉතා විශාල පෝෂක ප්‍රදේශයක් අයත් වේ. ප්‍රදේශයේ දිවි ගෙවන වල් අලින් ඇතුළු බොහෝ වනසතුන් සිය නිවහන බවට පත්කරගෙන ඇත්තේ මෙම වැව් පෝෂක ප්‍රදේශයයි.

වනෝද්‍යානයේ නැඟෙනහිර කොටස සම්පූර්ණයෙන් ම පාහේ වැසී ඇත්තේ කවුඩුල්ල, වැවෙනි. වනෝද්‍යානයේ බටහිරින් ඇත්තේ ඝණව වැඩුණු වනාන්තරයකි. වනෝද්‍යානයේ උතුරේ සිට දකුණට විහිදී ඇත්තේ වියළි කලාපීය ලක්ෂණයන්ගෙන් යුත් වන ගහණයක් සහිත කඳුවැටියකි. උද්‍යානයේ උතුරු කෙළවර කිතුල්උතුව ප්‍රදේශය දක්වා විහිදී යයි. උද්‍යානයේ දකුණු කෙළවර වන්නේ රොටවැව ගම්මානයයි.

බටහිරින් පිහිටි ගණව වැඩුණු වනාන්තරය සහිත කඳුවැටියට සමාන්තරව මින්නේරිය - කන්තලේ වැව් යාකෙරෙන යෝධ ඇල පිහිටා ඇත. (යෝධ ඇල ද මහසෙන් රජුගේ දැවැන්ත වාරි නිර්මාණයකි. සැතපුමකට අඟලේ බැස්මක් සහිත මෙම යෝධ ඇල හෙවත් ජය ගඟේ වාරි තාක්ෂණය අදට ද වාරි ඉංජිනේරුවන්ට රහසකි) කවුඩුල්ල ජාතික වනෝද්‍යානය මැදින් දිවෙන මෙම ඇල මාර්ගයෙන් ම කවඩුල්ල වැවට ද ජලය සැපයීම සිදු කරයි. එනම්, අඹන් ගඟ ඇලහැර දී හරස්කොට යෝධ ඇල හරහා ගිරිතලේ සහ මින්නේරිය යන වැව්වලට ජලය ගෙනයන මෙම වාරිව්‍යාපෘතියථ එතැනින්ද නොනැවතී තම ජලයෙන් කන්තලේ වැවට ද ජලය සැපයීම සිදු කරයි. අද මෙම යෝධ ඇල හෙවත් ජය ගඟ ද අපූරු පරිසර සද්ධතියකි. මෙය වනසතුන් රැසකට නිවහන සපයන ස්ථානයක් පමණක් නොව අලි ඇතුන් ඇතුළු ලොකු කුඩා වන සතුන්ගේ පවස නිවාලන පරිසරයකි. මෙම ඇල මාර්ගය නිවහන කරගනිමින් මත්ස්‍ය විශේෂ, උභය ජීවී විශේෂ හා උරඟ විශේෂ රැසක් ම දිවි ගෙවති. මෙම උරගුන් අතර කිඹුල්ලු කබරගොයි වැන්නෝ ද සිටිති. එසේ ම ජලජ කුරුල්ලන් රැසකගේ ම ආහාර භූමියක් ලෙසින් ද යෝධ ඇල හඳුන්වා දිය හැකි ය. මෙම ඇල මාර්ගය ඔස්සේ අපූරුවට වැඩී ඇති කුඹුක් ගස් පෙළ වනෝද්‍යානයට ගෙන එන්නේ අපූරු චමත්කාරයකි. එය ජලජ කුරුල්ලන්ට මෙන් ම නිතර ම රස්තියාදු වන වඳුරු රංචුවලට ද නවාතැන්පළකි.

කවුඩුල්ල නම් මෙම දැවැන්ත වාරි නිර්මාණය කරවන ලද්දේ මීට සියවස් 17 කට පමණ පෙර මහා මින්නේරිය වැව නිර්මාණය කර මින්නේරිය දෙවියන් නමින් ඉතිහාස ගත වූ මහසෙන් රජු විසිනි. කවුඩුල්ල වැව මහසෙන් රජුගේ ම නිර්මාණයක් ලෙසින් ඉතිහාසයේ බොහෝ තැන්වල සඳහන්ව තිබුණ ද එය මහසෙන් රජුගේ සොයුරිය වූ බිසෝ බණ්ඩාර කුමරිය විසින් නිර්මාණය කරවන ලද්දක්ය යනුවෙන් ජනප්‍රවාදවල සඳහන් වෙයි.

යෝධ ඇල සහ කවුඩුල්ල ජලාශය අතර ඇත්තේ තැන තැන වෘක්ෂ වැඩුණු ලඳු කැළෑවකි. මයිල, පළු, වීර වැනි ගස්වලින් සමන්විත මෙම ලඳු කැළෑව තුළ වල් අලින් යහමින් ගැවසේ. කවුඩුල්ල වනෝද්‍යානය තුළ වල් අලින් 150 සිට 300 දක්වා වූ සංඛ්‍යාවක් දැක බලාගත හැකි ය. කවුඩුල්ල වැව ආශ්‍රිතව වර්ෂය පුරා නේවාසිකව වාසය කරන වල් අලි ද වනෝද්‍යානයට යාබදව පිහිටි මින්නේරිය වනෝද්‍යානයේ සිට සංක්‍රමණය වන වල් අලි ද වශයෙන් දෙකොටසක් ලෙසින් මෙම වල් අලි හඳුනාගත හැකි ය.

කවුඩුල්ල ජලාශය වර්ෂය පුරා ම ජලයෙන් පිරී පවතින නිසාත්, අවට වනගහණය අලින්ට ගැවසීමට හොඳ නවාතැනක් වන නිසාත්, ආහාර හා ජලය ඇති පමණ පවතින නිසාත් මෙම පරිසරය වල් අලින්ගේ ගැවසීමට ඉතාම යෝග්‍ය ය. එමනිසා කවුඩුල්ල වනෝද්‍යානයේ දී සංචාරකයන්ට වල් අලින් දැක බලා ගැනීම එතරම් අපහසු කටයුත්තක් නොවේ. මේ නිසා ම දඹුල්ල, හබරණ වැනි ප්‍රදේශවල සංචාරයේ යෙදෙන දේශීය හා විදේශීය සංචාරකයෝ ද මින්නේරියට මෙන්ම කවුඩුල්ලට ද යෑමට බොහෝ සෙයින් ප්‍රිය කරති. දේශීය සංචාරකයන්ටත් වඩා කවුඩුල්ලට පැමිණීමට කැමැත්තක් දක්වන්නේ විදේශීය සංචාරකයන් ය. ඊට හේතු වී ඇත්තේ බොහෝ විට දඹුල්ල, සීගිරිය වැනි පුරාවිද්‍යාත්මක ස්ථාන දැකබලා ගැනීමට පැමිණෙන විදේශීය සංචාරකයන් ලැඟුම් ගන්නා සංචාරක හෝටල් රැසක් ම කවුඩුල්ල වනෝද්‍යානය අවට සහ හබරණ, දඹුල්ල වැනි ප්‍රදේශවල පිහිටා තිබීමයි.

වල් අලින් ගැන අප මෙහිදී විශේෂයෙන් සඳහන් කළ ද අනෙකුත් වන සතුන් ගැවසීම අතින් ද කවුඩුල්ලේ අඩුවක් නැත. දිවියා, වලසා, ගෝනා, තිත් මුවා, වල් ඌරා, වැලි මුවා, මීමින්නා ඇතුළු ක්ෂීරපායී සතුන් රැසක් ම මෙහි දිවි ගෙවති. කලින් සඳහන් කළ පරිදි උභය ජීවීන්, උරගුන්, පක්ෂීන් රැසක් ද, සමනලුන්, මොලන්කාවුන් (ගොලුබෙල්ලන්) මෙන්ම කෘමීන් වර්ග රැසක් ද මෙම වනෝද්‍යානය ආශ්‍රිතව දැකගත හැකි ය. කවුඩුල්ල වැව දැවැන්ත ජලාශයක් වන බැවින් මෙහි සිටින මත්ස්‍ය ප්‍රජාවේ විවිධත්වය ද වැදගත් ස්ථානයක් ගන්නා බව සඳහන් කළ යුතු ය.

ශාක හා සත්ව ප්‍රජාව අතින් කවුඩුල්ල වැදගත් තැනක් ගත්ත ද, සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් ද තිබුණ ද කවුඩුල්ල වනෝද්‍යානයේ සිරි නැරඹීමට ඇති ප්‍රධාන ම

26 පිටට